IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2015/2016

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2017 දෙසැම්බර්)

## BLE 302 - ජනගහන අධ්‍යයනය සහ මිනිස්බල සැලසුම්කරණය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. i. "ජනගහන අධ්‍යන"යනු කුමක්ද?

(ලකුණු 06)

ii. ජනගහනය පිළිබඳ අධ්‍යනයන් රටකට වැදගත් වන්නේ කුමන හේතු නිසාදැයි උදාහරණ දෙමින් විමසන්න.

(ලකුණු 06)

iii. ජනගහන අධ්‍යන වලදී භාවිතා කෙරෙන දත්ත ලබාගන්නා ප්‍රධාන මූලාශ්‍රයන් මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

02. i. ජනගහනයක වයස් සහ ප්‍රමිතිර ව්‍යුහය රටක සංවර්ධනය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. මර්ත්‍යතාව, සඵලතාව සහ සංක්‍රමණ යන සංකල්ප ජනගහන වෙනස්වීම කෙරෙහි බලපෑම් කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

03. ප්‍රජා විද්‍යා සංක්‍රාන්ති න්‍යාය කෙටියෙන් පැහැදිලි කර ශ්‍රී ලංකාවේ ජනගහනය වෙනස්වීම ප්‍රජා විද්‍යා සංක්‍රාන්ති න්‍යාය යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

04. i. "ජනගහනය වියපත්වීම" නිර්වචනය කරන්න.

(ලකුණු 04)

ii. වැඩිහිටි ජනගහනය ඉහළ යාම නිසා රටකට ඇතිවන සාමාජීය සහ ආර්ථික බලපෑම් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 16)

(මුළු ලකුණු 20)

05. i. "සංක්‍රමණ" යන සංකල්පය පැහැදිලි කර ජාත්‍යන්තර සංක්‍රමණය රටක සංවර්ධනය කෙරෙහි බලපෑම් කරන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ii. රටක අභ්‍යන්තර සංක්‍රමණ රටාවන් තීරණය කිරීම කෙරෙහි තල්ලු කිරීමේ සහ ඇද ගැනීමේ සාධක කොතෙක් දුරට වැදගත් වන්නේ දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. A. පහත සඳහන් ප්‍රජා විද්‍යාත්මක මිනුම් විස්තර කරන්න.

i. මූලික සඵලතා අනුපාතිකය සහ දළ උපත් අනුපාතිකය

ii. ළදරු මරණ අනුපාතිකය සහ මාතෘ මරණ අනුපාතිකය

iii. උපතේදී ජීවිත අපේක්ෂාව

(3 x 4 = ලකුණු 12)

B. පහත සඳහන් මාතෘකා කෙටියෙන් පැහැදිලි කරන්න.

i. සේවා නියුක්ති වර්ග (types of unemployment)

ii. ශ්‍රී ලංකාවේ නාගරීකරණ ප්‍රවනතා (urbanization trends in Sri Lanka)

(4 x 2 = ලකුණු 08)

(මුළු ලකුණු 20)

* * * * *